


සැඟවුණු
කුරුමානම





හානේ...... සුමේධ අයියා.. මේපාර නම් නිවාඩුව ජයටම සමරන්න වගෙයි...
ජය කෙසේ වෙතත් වත්සලා නංගී... නිවිසැනසිල්ලේ ගමට වෙලා මේ දවස් ටිකේ ඉන්න ලැබුනොත් ඇති..
කොන්ක්‍රීට් හුළඟ එපා වෙලා...
නංගී කොහේ යන ගමන්ද......?
පෝස්ට් ඔෆිස් එකට ආවා..... මාත් යන්නේ ගෙදර... යං.....
නැන්දා මග බලාන ඉන්නේ අයියා එනකල්.....
ම්ම්ම්ම්...... ඒක ඉතිං අමුතු දෙයක් නෙමෙයිනේ
ඔයාගේ ට්‍රේනින්ග් කටයුතු කොහොමද නංගී.....?
කරගෙන යනවා අයියේ... ඒක නෙමෙයි.... මම අහන්න හිටියේ අයියා අර පැහැදිලි කරලා දෙනවා කිව්ව කාරණේ ගැන....?
අර තැනැත්තන් වෙළඳාම ගැන..?
ඒ මොකක්ද නංගී....?
ඕ...... Human Trafficking....
ඇත්තටම අයියේ මිනිස්සුන්ව විකුණනවද....?



ඔව්... මිනිස්සු කියලා කිව්වාම නංගි හැමෝම.. වැඩිහිටි කාන්තාවන්.. ගැහැණු දරුවන්...
පිරිමි දරුවන්... බාලවයස්කාර දරුවන්..... වැඩිහිටි පිරිමි... මේ හැමෝමනේ..
එයාලවත් විකුණනවද...?
ඔව්... මේ හැම කෙනෙක්වම විකිණීමේ කුඨ ජාවාරම් කරන මිනිස්සු ඉන්නවා..
ඒ වුනාට අයියේ.. එහෙම මිනිස්සුන්ව විකුණන්න පුළුවන්ද....?
බැහැ.. කොහෙත්ම බැහැ.. ඒක නීති විරෝධි වැඩක්...
එහෙනම් විකුණන්නේ කොහොමද..? හරි.. හරි.. මට තේරුණා..
මොකක්ද..?
ඔය කාන්තාවනුයි ගැහැණු දරුවනුයි විකුණන්නේ ගණිකා වෘත්තියට නේද..?
එතකොට... වහල්භාවයේ යොදවන්න.. ශරීර අංග ඉවත් කරලා විකුණන්න... ලිංගික අයුතු ප්‍රයෝජන ගන්න...
එතකොට අයියේ නීති විරෝධී නොවන සේවයක යෙදවීම වරදක් වෙන්න බෑනේ...
නෑ... ඒ කතාව වැරදියි නංගි.. මොකද....
ඒකටම විතරක් නෙමෙයි.. ඔය... එක එක ව්‍යාපෘතිවල අනිවාර්ය සේවයේ යොදවන්න...
මෙතන යොදවන සේවය නීත්‍යා-නුකූලද නැද්ද කියනඑක නෙමෙයි සලකා බලන්න ඕන..
සේවයේ යෙදෙන කෙනා ඒක කැමැත්තෙන්ද කරන්නේ කියලා හොයලා බලන එකයි වැදගත්...



"....උදාහරණයක් විදියට...., හම්බන්තොට උන්න කමලා බලෙන් රැගෙන යන සිරිපාල පුත්තලමේ කරවල වාඩියක කරවල වේලන්න එම කරවල වාඩියේ හිමියාට විකුණනවා...
කරවල වාඩියේ අයිතිකාරයා කමලාට කන්න බොන්න අඳින්න දෙනවා.... ඒත් කමලාට වාඩියෙන් පිට වෙන්න දෙන්නෙ නෑ....."
කමලා බයට එතන වැඩකරනවා. කරවල වේලන එක නීති විරෝධී වැඩක් නොවුනට...
....කෙනෙක් බලෙන් තියාගැනීම නීති විරෝධී වැඩක්.....
එතකොට කමලා කරල තියෙන්නේ අපරාධ වරදක්ද?
නෑ... කමලා නෙවෙයි. සිරිපාලයි කරවල වාඩියේ හිමිකාරයයි..
.....තමයි අපරාධ වරදක් කරල තියෙන්නේ කමලා තමයි මෙතන වින්දිත පාර්ශවය....
මොකද්ද ඔය අපරාධ වරද?
තැනැත්තන් වෙළෙඳාම් කිරීම (Trafficking) කියන වරද......
ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 2006 අංක 16 දරණ සංශෝධන..
....පනතේ 360 (ඇ) වගන්තිය අනුව මේක බරපතල වරදක්....
මොන වගේ දඬුවමක්ද ඔය වරදට දෙන්නේ අයියේ...?



අවුරුදු 2 ඉඳලා 20 දක්වා වූ සිරදඬුවමකට අමතරව දඩයකටත් යටත් කරන්න පුළුවන්......
වින්දිතයා ළමයෙක් නම් දඬුවම තවත් සැරයි.....
එතකොට ලැබෙන අවම දඬුවම පවා අවුරුදු 3 ක සිරදඬුවමක්....
දඩයක් ගහන්නත් පුළුවන්. අවුරුදු 20 දක්වාම සිර දඬුවම් දෙන්න පුළුවන්...............
එතකොට අයියේ දැන් ඔය වරද සිද්ධ වෙන්නේ බලහත්කාරයෙන් විකුණුවොත් විතරයිද....?
නෑ... නෑ.... බලහත්කාරය කියන්නේ ඒකේ එක අවස්ථාවක් විතරයි.....
මේකනේ නංගි....
...යම් කෙනෙක් බලහත්කාරයෙන් හරි.... වංචාවෙන් හරි..... රැවටීමෙන් හරි..... යම් පෙළඹවීමකින් හරි....
යම් කෙනෙකුගේ පීඩාවකින් අයුතු ප්‍රයෝජන ගන්න උත්සාහ කරත්.... මෙම වරදට වැටෙනවා...
මෙහෙම හිතන්නකෝ......
උසස් පෙළ විභාගේ ප්‍රතිඵල එනකම් බලන් ඉන්න යමුණා.......
...ගෙදර තියෙන අගහිගකම් නිසා රැකියාවක් හොයනවා..........



කොළඹ නිතර යන එන ගමේ ඉන්න සිල්වා මහත්තයා පොරොන්දු වෙනවා යමුණාට කොළඹ ආයුර්වේද මධ්‍යස්ථානයක කවුන්ටරයක රැකියාවක් හොයා දෙන්න.....
ඒ අනුව යමුණා, සිල්වා මහත්තයා එක්ක සිය මව සමග එම රැකියා ස්ථානයට යනවා.......
AYURVEDA CLINIC
ආයුර්වේද මධ්‍යස්ථානයේ සිටින එහි හිමිකාරිය, ලිසී නෝනා එය ආයුර්වේද මධ්‍යස්ථානයක් බව පවසමින් යමුණාව එහි නතර කර ගන්නවා.
ඒත් පස්සේ තමයි යමුණා දැනගන්නේ ඒක මුදලට පුරුෂයින් සම්භාහනය කරන තැනක් බවත්...
ඒකට එන පුද්ගලයින් ට අයුතු ලිංගික සන්තර්පනයන් කිරීමට ඔවුන්ට සිදුවන බවත්.........
සිල්වා මහතාගේ ව්‍යාපාරය වන්නේ ගම්බද තරුණියන් මේවගේ තැන්වලට විකිණීමයි.................



දැන් මේ වෙලාවේ යමුණා වංචාවට හසුවෙලා..... ඒ හිංදා සිල්වාත් ලිසී නෝනත් දෙන්නම
තැනැත්තන් වෙළඳාම් කිරීම (Trafficking) කියන වරද සිදු කරලා තියෙනවා.
ඉතින් යමුණා වැඩිහිටියෙක් නේද? වයසත් 18 සම්පූර්ණයිනේ...
ඔව්. ඒක මෙතනදී ගැටළුවක් වෙන්නේ නෑ නංගි... වැඩිහිටියෙක් වුනත්...
වංචාවකට ලක්වෙන්න පුළුවන්. වංචාවක් වුණා කියන එකයි ඔප්පු වෙන්න ඕන.
දෙන්නා වාඩිවෙලා බර කතාවක් වගෙයි....
ආා.. ජගත් අයියා..?
අයියේ...
අයියා හම්බවුනු එකත් හොඳයි.. අපිට මේ ටික යන්න ලේසියි... නේද සුමේධ අයියේ..?
ඉතිං....? දෙන්නාගේ වැදගත් මාතෘකාව ගැන කියන්නකෝ.. අපිටත් දැනගන්න.....
අයියා මිනිස් වෙළඳාම ගැන දන්නවද...?
ටිකක් විතර.... මල්ලි ඔය ගැන දන්නවා නේද? විස්තර කියන්නකෝ බලන්න...?
මෙහෙමනේ අයියේ.. මම උදාහරණයකින්ම පටන් ගන්නම්..
ඇල්ප්‍රඩ් මහත්තයා කියලා කෙනෙක් කංසා හේනක් වවනවා...


මේකේ වැඩට මිනිස්සු සපයන්නේ ගමේ පෝරිසාදයෙක් වන නලින්... සියදෝරිස් ගමේ ඉන්න අහිංසක මනුස්සයෙක්..
නලින් සිරිමල් එක්ක කතා කරගෙන සිරිමල්ගේ වාහනෙන් සියදෝරිස්ව බලෙන්ම අරගෙන ගිහින්......
ඇල්ප්‍රඩ් මහත්තයාට රුපියල් ලක්ෂයකට විකුණලා සල්ලි බෙදා ගන්නවා...
ආපහු එන්න පාරක්වත් දන්නෙ නැති සියදෝරිස් කංසා වගාවටම වෙලා වගා කරමින් එතන ඉන්නවා......
මෙතනදී සිරිමල් කරලා තියෙන්නේ වැරැද්දක්.... නලින් කරන දේ දැන දැනම ඊට සහයෝගය දීලා ප්‍රවාහන පහසුකම දීලා තියනවා...
එහෙම බැලුවාම සිරිමලුත් ..... තැනැත්තන් වෙළඳාම් කිරීම (Trafficking) කියන වරද සිදුකරලා...
හැබැයි.. නලින් සිරිමල්ටත් මේ ගැන වසන් කරලා වාහනේ කුළී පදනමට ගත්තානම්....?
එතකොට නම් සිරිමල් වැරදි කාරයෙක් වෙන්නේ නෑ....... හැබැයි....
....සිරිමල් ඒ ගැන මුකුත් දැන ගෙන සිටියේ නැති බව.....
.....ඔප්පු කරන්න වෙනවා... ඒ වගකීම තියෙන්නේ සිරිමල්ට......
වැරදීමකින් හරි නලින් කිව්වොත් සිරිමල් සේරම දැනගෙන හිටියා කියල... නිකරුණේ සිරිමල් අමාරුවේ වැටෙනවා.......
උසාවි ගානේ බන්ධනාගාර ගානේ යන්න වෙනවා. නීතීඥ--වරුන්ට මුදල් ගෙවා ගෙන..
.......සිය නිර්දෝෂි භාවය ඔප්පු කරන්න සිද්ද වෙනවා.


කලින් හිටිය ඇල්ප්‍රඩ් මහත්තයත් වැරදිකාරයෙක් නේද.....?
අනිවාර්යෙන්ම... මිලදී ගැනීම සේවයට බඳවා ගැනීම කියන අවස්ථා දෙකම එතන තියෙනවනේ.....
එතකොට අයියේ.. රහසිගතව රඳවා තියාගැනීම වගේ දෙයක් වෙන්නේ කොහොමද.....?
මේකනේ... සමහර පුද්ගලයින් ළමයින් පැහැරගෙන ගිහින්.....
ත්‍රස්තවාදී සංවිධානවලට විකුණුවාම ඒ ළමුන්ව.....
.....රඳවා තියාගෙන එයාලට යුධ පුහුණුව දීලා යුද්ධයට යෙදෙව්වනේ. අන්න ඒක එවැනි අවස්ථාවක්.....
දැන් මල්ලි.... මේ තැනැත්තන් වෙළෙඳාම් කිරීම (Trafficking) කියන වරද සිද්දවෙන්න කෙනෙක් මුදලකටම විකුණන්නම ඕනද?
නෑ එහෙම වෙන්නම ඕන නෑ අයියේ... චුට්ටක් ඕක නවත්තන්නකෝ.....
ඒකට මම නිදර්ශන කීපයක් දෙන්නම්කෝ එතකොට හොඳටම තේරේවි.



ටවුමේ ඉන්න ප්‍රනාන්දු ගමේ ඉන්න නීල්ට කියනවා තමුන්ගේ නිවසේ මෙහෙකාර වැඩට ගමෙන් කොල්ලෙක් ගෙනත් දුන්නොත්..........
ගමේ තමන්ගේ නමින් ඇති කුඹුරු ඉඩම නීල්ගේ නමට ලියලා දෙනවා කියලා...
ඉතිං..... වයස අවුරුදු දාහතක් වන සමන්තවත් එයාගේ දෙමාපියන්වත් රවටන නීල්...
සමන්තව ගෙනත් ප්‍රනාන්දුට භාරදීලා ඉඩම තමන්ගේ නමට ලියා ගන්නවා..
ඩයස් කියන්නේ විදේශ ආයතනයක් එක්ක ගණුදෙනු කරන පුද්ගලයෙක්.. ඩයස්ට විදේශිකයෙක් කියනවා අමාරු තත්වයේ ඉන්න රෝගීන් කීපදෙනෙකු වෙනුවෙන්.......
...වකුගඩු කීපයක් අවශ්‍යය වෙලා තියන බවත්...
මෙහෙකාර සේවයට ගන්න පිරිසක් එවන විදියට අඟවලා කාන්තාවන් 10 දෙනෙකු රට යවන්නත් ඒ වෙනුවෙන් ඩයස්ගේ සහ ඔහුගේ පවුලේ සාමාජිකයින්ට....
විදේශ රටක පුරවැසි භාවය ලබාදීමට පුලුවන් බවත්... ඉතිං.. ඩයස් කරන්නේ කාන්තාවන් රවටලා විදේශගත කරවන්න පටන් ගන්නවා......
රහසින් ගණිකා නිවාසයක් පවත්වාගෙන යන කුමාරි විදේශ රටක ඉන්න ව්‍යාපාරිකයෙක් වන ඇල්ෆ්‍රඩ් එක්ක ගිවිසුමකට එලඹෙනවා..


ඒ විදේශ කාන්තාවන් සහ ලාංකීය කාන්තාවන් තමන්ගේ ව්‍යාපාර කටයුතු සඳහා හුවමාරු කරගන්නයි...
ඉතිං ඒ කාන්තාවන්ට විදේශ රැකියා සොයලා දෙනවා කියලා රවටලා ඒ අයව රට යවනවා...
ඊළඟ කෙනා විදුර.... ප්‍රසිද්ධ ටෙලිනාට්‍ය නළුවෙක්..... නාට්‍යයක රඟපාන්න අවස්ථාව දෙනවා කියලා පුහුණු වැඩමුළුවක් පවත්වන මුවාවෙන් ගම්වල තරුණියන් රවටලා සංගමයකට බඳවා ගන්නවා....
ඉන් පස්සේ මේ තරුණියන්ව මුදලට විකුණන්න වෙබ් අඩවියක් මාර්ගයෙන් එයාලව ප්‍රසිද්ධියට පත් කරන්න රහසේම සැලසුම් කරනවා....
ලයනල් කියන්නේ ප්‍රසිද්ධ රූපවාහිනී වැඩසටහන් අධ්‍යක්ෂකවරයෙක්... මෙයා කරන්නේ ජනප්‍රිය රියලිටි වැඩසටහනක් පෙන්නලා ඒක මුවාවෙන් ළමුන් එක්රැස් කරගෙන පුහුණු වැඩමුළුවක් පවත්වනවා කියලා රවටලා රඳවා තියාගෙන.....
වෙබ් අඩවියක් මාර්ගෙන් එයාලව ප්‍රසිද්ධියට පත්කරන එක... මේකට ලයනල්ට සහය දෙන්නේ එයාගේ හිතවතියක් වන අමීෂා... එයා ඒ දැන්වීම අදාල වෙබ් අඩවියේ...........
තව දුරටත් ප්‍රසිද්ධ කිරීමේ අරමුණකින් තව තව විවිධ සමාජ මාධ්‍යජාල වල ප්‍රවර්ධනය කරලා ලයනල්ට සහාය දෙනවා......



ටෙලි නාට්‍යකට අලුත් නළු නිළියන් ගන්න වැඩමුළුවක් පවත්වනවා කියලා තරුණ ගැහැණු ළමුන්ව රවටන විදුර එයාලව් ගෙන්නගෙන රඳවලා තියා ගන්නවා..
ඊට පස්සේ එයාලව වෙබ් අඩවියක ප්‍රසිද්ධියට පත් කරනවා විකිණීමේ අදහසින්... ඒ වෙබ් අඩවියෙන් ලැබෙන ඉල්ලීම් අනුව තෝරා ගත් තරුණියන්....
ටෙලි නාට්‍යක රඟපාන්න යවනවා කියලා තව දුරටත්..
.....රවටලා නොයෙක් ලිංගික ක්‍රියාකාරකම්වල යොදවනවා... ඒකට යොදා ගන්නේ....
බොරු රංගන ස්ථානයක් විදියට සකස් කළ පරණ ගොඩනැගිල්ලක්....
මේ සේරටම සහයෝගය දෙන්නේ අනුර කියලා පුද්ගලයෙක්....
අනාථ නිවාසයක පාලිකාවක් වන ලූසියාව රොඩ්රිගෝ පොළඹවා ගන්නේ විදේශිකයින්ට නිවාසයේ ළමයින්ව විකුණන අදහසින්......
ඒ වෙනුවට රොඩ්රිගෝගෙන් ලූසියාට සුඛෝපභෝගී වාහනයක් ලැබෙනවා.....
ඉන් සතුටුවන ලූසියා දෙපාරක් නොහිතාම සමාජ ජාලා වලට මුදා හරින්න ළමයින්ගේ ඡායාරූප රොඩ්රිගෝට දෙන්න තීරණය කරනවා.......



මහලු සුමනා ගමේ කඩේට හැලප හදලා
විකුණලා එයින් ලැබෙන සුලු මුදලෙන් තමයි
ජීවත් වුනේ.... ඇය හිටියේ ගමේ පන්සලේ
ඉඩමක පුංචි පැලක් හදාගෙන තනියම.....


මේ අතරේ ඩෙනිසන් නම්
පුද්ගලයෙක් සුමනාට
ඇස්කණ්නාඩි අරන් දෙන
බවට පොරොන්දු වෙලා
සුමනාව.......
...කොළඹ එක්ක ඇවිත්
ශාන්ත නම් හෝටල්
හිමියෙකුට බාරදෙනවා...
HOTEL
ඒ වෙනුවෙන් මාසෙකට
රුපියල් 10.000 ක් ශාන්තගෙන්
ඩෙනිසන්ට ලැබුනා...
සුමනාට ඉන්න තැනක්
ලැබුනත් ඇයට වෙන්නේ
හෝටලේ උයන්න, කෝප්ප
පිගන් හෝදන්න...
සුමනා කැමති ගමේ ගිහින්
පෝයට සිල් අරගෙන නිදහසේ
ජීවත් වෙන්න.... ඒත් යන්න
විදියක් නැති නිසා ඇය
එතනම ජීවත් වුණා.....



කලින් කිව්ව සිල්වා, ලිසි නෝනා, කුමාරි, ඇල්ප්‍රඩ්, විදුර, ලයනල්, අමීෂා, අනුර,
රොඩ්රිගෝ, ලුසියා, ශාන්ත හා ඩෙනිසන් කියන අය තැනැත්තන් වෙළඳාම්
කිරීම (Trafficking) කියන වරද කළ පුද්ගලයින් වශයෙන් නීතියෙන් හඳුනා
ගන්නවා.....



එතකොට මල්ලි
දෙමාපියන්ට පුළුවන්ද තමන්ගේ
ළමයින්ව මේ විදියට
විකුණන්න......?


කොහෙත්ම බැහැ.... දෙමාපියන්ට හෝ කවුරු හරි ළමයින්ගේ භාරකාරයෙක්ට... පාසලක ගුරුවරුන්ට.. විදුහල්පතිවරයෙකුට....
නැත්නම් අනාථ නිවාසයක පාලිකාවකට... පාලකයෙකුට.... හරි නේවාසිකාගාර පාලිකාවකට පාලකයෙකුට.... ආයතන ප්‍රධානියෙකුට හෝ
කිසිම පුද්ගලයෙකුට එහෙම කරන්න නීතිමය බලයක් නෑ......
ඒ කියන්නේ දෙමාපියන්ට වුනත් දඬුවම ක්‍රියාත්මකයි...
අනිවාර්යයෙන්ම..... දෙමාපියන් කියලා කිසිම සමාවක් නෑ..... දෙමාපියන්ට පවා විරුද්ධව නීතිමය පියවර ගන්න පුළුවන්.....
හොඳයි.... කෙනෙක්ව වංචාවෙන් රවටලා ගෙනල්ලා විකුණනවා යම් ව්‍යාපාරයක් වෙනුවෙන්....
ඒ පුද්ගලයා ඒකට බැඳෙන්නේ එයාගේ කැමැත්තෙන්..
එහෙම කෙනෙක් කැමැත්තෙන් බැඳුනා කියන එක ඔප්පු කිරීමේ වගකීම පැවරෙන්නේ....
....ව්‍යාපාරයේ හිමිකරුට හරි විකුණූ පුද්ගලයාටයි.... නැතිනම් බඳවා ගැනීම් කරන පුද්ගලයාටයි... ඒක ඔප්පු කිරීම අනිවාර්යයයි..
එහෙම නොවුනොත්.... දණ්ඩ නීති සංග්‍රහයේ 360 වගන්තිය යටතේ එන වැරදි වලට වරෙන්තුවක් නැතුව හිරබාරයට ගන්න පුළුවන්.....
ඇප ලබාගැනීම ඉතාමත් අමාරුයි... සමථයකට පත් කරන්නත් බෑ..
ඒ නිසා මේ චෝදනාවලට ලක් වෙන කෙනෙක් නඩු විභාගය ඉවර වෙනකල් බන්ධනාගාර ගත කරන්න පුළුවන්....



ඒ විතරක් නෙමෙයි.. ඇප ලබාගැනීම ඉතාමත් අමාරුයි.... නිවැරදිකම ඔප්පු කරන්න නීතිඥ සේවය.....
....ලබා ගන්නත් වෙනවා... සාක්ෂි අවශ්‍ය වෙනවා.. ලේසි වෙන්නේ නෑ....
අනිත් එක වින්දිත පාර්ශ්වය ළමයෙක් නම් කැමැත්ත කියන එක අදාළ වෙන්නෙම නෑ....
ඒ කියන්නේ ළමයෙක්ව රවටලා යම් රැකියාවක යෙදෙව්වොත්......
ඒක එයා කැමැත්තෙන් කරන්නේ කියලා ඔප්පු කළාට වැඩක් වෙන්නේ නෑ කියන එකද.....?
හරියටම හරි... ළමයාගේ කැමැත්ත තිබුණත් නැතත් චූදිතයින් වැරදිකරුවන් කරන්න ඒක අදාළ වෙන්නේ නෑ...
ඒ කියන්නේ වින්දිතයා වයස අවුරුදු 18 ට අඩු කෙනෙක් නම් එයාගේ කැමැත්ත කියන එක අධිකරණය සලකා බලන සාධකයක් නෙමෙයි...
තැනැත්තන් වෙළඳාම් කිරීම(Trafficking) කියන වරද සිදුවෙන්න සමාජයේ ඇති වෙන හේතු මොනවද...?
ඔව්... කාරණා කීපයක් අදාළ වෙන්න පුළුවන්... පළමුවෙනි එක....
මූලිකව හැම කෙනාටම සමාජයේ රැකවරණය නැතිවීම...
එතනදි අපි හැම කෙනෙකුටම වගකීමක් තියනවා... දෙමාපියන්, වැඩිහිටියන්, ගුරුවරුන්, රජයේ නිළධාරීන්, ආගමික නායකයින්... වගේම මුළු සමාජයම.....
දැනුවත් වෙලා එකිනෙකා ආරක්ෂා වීමට කටයුතු කරනවා නම්......
...මේ වැරදි සිදුවීම් වලින් අපිට වැලකෙන්න පුළුවන්කම තියනවා..
දෙවෙනි කාරණය.... දුප්පත්කම එක්ක බැඳුණු අසරණකම...
හොඳම උදාහරණය තමයි... දෙමාපියන්ම විසින්ම තම දරුවන් විකිණීමේ තත්ත්වයක් උදාවීම......
මිළ මුදල් මූලික සාධකයක් වෙනකොට යම් කෙනෙකුට දරුවන් වරදට පොළඹවා ගැනීමේ හැකියාව වැඩිවෙනවා...




## සහායයන් සඳහා දුරකථන අංක

| | |
|---|---|
| පොලීසිය | - 119 |
| ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශය | - 011 244 4444 |
| ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | - 1989 |
| තැනැත්තන් වෙළඳාම ජාවාරම් විමර්ශන හා සමුද්‍රීය අපරාධ විමර්ශන කොට්ඨාශය | - 011 251 4374 |
| සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය(IOM) | - 076 658 8688 |
| මිනිස් වෙළඳාමට එරෙහි ජාතික කාර්යසාධක බලකාය (www.nahttf.gov.lk) | - 076 844 7700 |
| ජාතික ළමා ආරක්ෂක අධිකාරිය | - 1929 |

පිටපත: නිතිඥ මේජර් සඳුන් ගුණවර්ධන
ආරක්ෂක අමාත්‍යාංශය

රූ සටහන්: විල්ටන් රාජපක්ෂ

IOM
UN MIGRATION